# සුපිළිපන් සංස්කෘතියක්
# ක්ලීන් ශ්‍රී ලංකාවක්

ජාතික මෙහෙයුම සඳහා වන

**මාධ්‍ය මාර්ගෝපදේශය**

*Media Guidelines for the National Operation*

නිකුත් කරන ලද්දේ — Clean Sri Lanka මාධ්‍ය සහ සන්නිවේදන අංශය
*Socially · Environmentally · Ethically*

## 1. හැඳින්වීම සහ සුපිළිපන් භාවය

### සුපිළිපන් භාවය යනු කුමක්ද?

"සුපිළිපන් භාවය" (Integrity) යනු හුදෙක් වංචාවෙන්, දූෂණයෙන් හෝ අල්ලසින් තොරවීම වැනි සීමාන්විත නිර්වචනවලින් ඔබ්බට ගිය, පෞද්ගලික ලාභයන්ට වඩා පොදු මහජන යහපතට නිරන්තරයෙන් ප්‍රමුඛතාවය දෙන උදාර ප්‍රතිපත්තියකි.

එය ප්‍රතිපත්තිගරුක බව, අවංකභාවය, සදාචාරාත්මක හැසිරීම සහ වගකීම් සහගත බව තම ජීවන රටාව කර ගැනීමක් වන අතර එහි මූලික හරය වනුයේ කිසිවෙකු තමන් දෙස බලා නොසිටින, කිසිදු බාහිර නිරීක්ෂණයකට හෝ අධීක්ෂණයකට ලක් නොවන අවස්ථාවකදී වුවද, ස්වයං-පාලනයකින් යුතුව හෘද සාක්ෂියට එකඟව නිවැරදි සහ සදාචාරාත්මක දේ සිදු කිරීමයි.

## 2. ජාතික මෙහෙයුමේ අරමුණු


"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා ක්‍රියාවට නැංවෙන මෙම ජාතික මෙහෙයුම සහ ජාතික සුපිළිපන් සතිය හරහා අප බලාපොරොත්තු වන්නේ:

- සමස්ත රාජ්‍ය නිලධාරීන් ජාතික සුපිළිපන් සතියේ ක්‍රියාකාරකම් පිළිබඳව මැනවින් දැනුවත් කරමින්, රාජ්‍ය සේවයේ ආචාරධර්මීය වටිනාකම් ශක්තිමත් කිරීම සඳහා ඔවුන් සක්‍රීයව හා වගකීම් සහගතව දායක කරවා ගැනීම.
- රාජ්‍ය පරිපාලන පද්ධතිය තුළ සිදුවන මෙම සදාචාරාත්මක සහ ගුණාත්මක යහපත් පරිවර්තනය පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කරමින්, රාජ්‍ය යාන්ත්‍රණය කෙරෙහි මහජන විශ්වාසය සහ ගෞරවය යළි ගොඩනැගීම.
- නීතිමය දඬුවම්වලට පමණක් සීමා නොවී, රාජ්‍ය නිලධාරියාගේ ආකල්පමය වෙනසක් ඔස්සේ රාජ්‍ය සේවයෙන් සහ සමස්ත සමාජයෙන් වංචාව, දූෂණය, නාස්තිය සහ අල්ලස සහමුලින්ම පිටුදැකීමේ පණිවිඩය ප්‍රබල ලෙස සමාජගත කිරීම.

## 3. සන්නාම අනන්‍යතාවය

ව්‍යාපෘතියට අදාළ සියලුම සන්නිවේදන කටයුතුවලදී (Social Media, බැනර්, පෝස්ටර්) "Clean Sri Lanka" සන්නාම අනන්‍යතාවය ඒකාකාරීව භාවිත කළ යුතුය.

> 🔗 **නිල ලාංඡන (Logos) — Digital Format**
> **Google Drive:**
> drive.google.com/drive/folders/1ELK5Cr37aXnZkJS08XZFjW7VbQSU5JeX




### නිල වර්ණ පැලට්ටුව (Official Color Palette)

| භාවිතය (Usage) | වර්ණය (Color) | Hex කේතය |
|---|---|---|
| වෙනස් වෙමු - වෙනස් කරමු (තද නිල්) | | #0066A8 |
| වෙනස් වෙමු - වෙනස් කරමු (සියුම් නිල්) | | #009BD2 |
| වෙනස් වෙමු - වෙනස් කරමු (ග්‍රේඩියන්ට් උච්ච) | | #FBB042 |
| වෙනස් වෙමු - වෙනස් කරමු (ග්‍රේඩියන්ට් මධ්‍ය) | | #EF4137 |
| වෙනස් වෙමු - වෙනස් කරමු (ග්‍රේඩියන්ට් අවසාන) | | #BE202E |
| Clean Sri Lanka — Primary Blue | | #33A5CB |
| Clean Sri Lanka — Accent Green | | #88BB40 |

## 4. පොදු සන්නාම යෙදවුම්

### Social Media Posts (ෆේස්බුක් / ඉන්ස්ටග්‍රෑම්)

- පළමු ලාංඡනය සඳහා නිල් පසුබිම් මත තැඹිලි/රතු වර්ණවලින් වැදගත් කොටස් කැපී පෙනෙන සේ (Highlights) ග්‍රැෆික්ස් නිර්මාණය කරන්න.
- "Clean Sri Lanka" සඳහා සුදු හෝ ලා අළු (Light Gray) පසුබිම් වැඩිපුර භාවිත කරමින්, කොළ සහ නිල් වර්ණ සංකලනයෙන් පිරිසිදු සහ ස්වාභාවික පෙනුමක් ලබා දෙන්න.
- **ද්විභාෂා භාවිතය (Bilingual Requirement): "වෙනස් වෙමු - වෙනස් කරමු" ලාංඡනය භාවිත කරන සෑම අවස්ථාවකදීම එය සිංහල සහ දෙමළ ("மாறுவோம் - மாற்றுவோம்") යන භාෂා දෙකෙන්ම අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතුය. කිසිදු හේතුවක් මත එක් භාෂාවක් පමණක් වෙන් කර භාවිත නොකළ යුතුය.**

- පෝස්ටරයේ දකුණුපස පහළ කෙළවරේ ලාංඡන ද්විත්වයම පැත්තකින් පැත්ත සිටින සේ (Side-by-Side) තැබිය යුතුය — "වෙනස් වෙමු - වෙනස් කරමු" වම් පසින්, Clean Sri Lanka ප්‍රධාන ලාංඡනය දකුණු පසින්.
- ලෝගෝ භාවිතය: පසුබිම් වර්ණය තද වැඩි නම් ලාංඡනවල සම්පූර්ණ සුදු (White / Negative) සංස්කරණයන් භාවිත කරන්න. ලාංඡනය වටා ප්‍රමාණවත් Clear Space තබා ගැනීමට වගබලා ගන්න.

### සමාජ මාධ්‍ය ආවරණ ඡායාරූපය (Cover Image)

Cover Image එක සඳහා පහත Drive Link එකේ ඇති නිල රූපය පමණක් භාවිත කරන්න:

> **Google Drive:**
> drive.google.com/drive/folders/1z8OMxVeAO4x239MS4PGunWQoVpOxwq3w

## 5. සමාජ මාධ්‍ය සහ සම්බන්ධීකරණ ක්‍රියාවලිය

සියලුම ආයතන සහ දිස්ත්‍රික් මට්ටමේ කණ්ඩායම් පහත සඳහන් සන්නිවේදන ක්‍රියාවලිය අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතුය:

- සමාජ මාධ්‍ය කළමනාකරුවන්ගේ තොරතුරු: සෑම ආයතනයකම සහ දිස්ත්‍රික්කයකම සමාජ මාධ්‍ය පිටු හසුරුවන නිලධාරීන්ගේ (Social Media Handlers) නම සහ දුරකථන අංක වහාම පහත WhatsApp අංකයට ලබාදෙන්න.
- පිටු සබැඳි හුවමාරුව (Page Links): ඔබ පවත්වාගෙන යනු ලබන සියලුම නිල සමාජ මාධ්‍ය පිටුවල සබැඳි (Links) සහ මෙම වැඩසටහනට අදාළ Post Links, Clean Sri Lanka WhatsApp අංකය වෙත එවිය යුතුය.
- පෝස්ට් පළ කිරීමේ කාලසටහන (Posting Schedule): Clean Sri Lanka මධ්‍යම ඒකකය විසින් නිල වශයෙන් සකස් කර එවනු ලබන Post, Videos සහ පණිවිඩ, නියම කරනු ලබන දින හා වේලාවන්හිදී (Schedule) ඔබගේ පිටුවල අනිවාර්යයෙන්ම පළ (Publish) කළ යුතුය.

## 6. ක්ෂේත්‍ර දත්ත සහ මාධ්‍ය ද්‍රව්‍ය එවීමේ ක්‍රියාවලිය

ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා සිදු කෙරෙන වැඩසටහන්වල ප්‍රගතිය වාර්තා කිරීම සඳහා පහත ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න:

- ඡායාරූප සහ වීඩියෝ (Photos & Videos): සිදු කරන වැඩසටහන්වල පැහැදිලි ඡායාරූප සහ කෙටි වීඩියෝ දර්ශන "Document" එකක් ලෙස පහත WhatsApp අංකයට එවිය යුතුය.
- පාගමන් සහ විශේෂ වැඩසටහන් (Rallies & Events): සංවිධානය කරනු ලබන දැනුවත් කිරීමේ පාගමන් (Awareness Walks / Campaigns) සහ වැඩසටහන්වල උසස් තත්ත්වයේ වීඩියෝ දර්ශන (විශේෂයෙන් ජනතාවගේ සහභාගීත්වය සහ අදාළ පාඨයන් පෙනෙන පරිදි) Clean Sri Lanka වෙත ලැබීමට සැලැස්වීම අනිවාර්ය වේ.

📱 **නිල WhatsApp සම්බන්ධතා අංකය**

**0769808237**

*(ක්ෂේත්‍ර ඡායාරූප/වීඩියෝ, පිටු සබැඳි සහ නිලධාරී තොරතුරු එවීම සඳහා පමණි)*

## 7. මාධ්‍ය ප්‍රකාශන සහ සම්මුඛ සාකච්ඡා මාර්ගෝපදේශ

ආයතන ප්‍රධානීන් හෝ දිස්ත්‍රික් නියෝජිතයින් ප්‍රධාන මාධ්‍ය (TV / Radio / Newspapers) හෝ සමාජ මාධ්‍ය වෙත ප්‍රකාශයන් (Statements / Interviews) ලබා දීමේදී පහත කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කළ යුතුය:

- සුපිළිපන් භාවය පිළිබඳ පැහැදිලිව, උදාහරණ සහිතව විස්තර කරන්න.
- ව්‍යාපෘතියේ අරමුණ පැහැදිලි කිරීම:
    - සමස්ත රාජ්‍ය සේවකයන් ජාතික සුපිළිපන් සතියේ ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන් ඒ සඳහා සක්‍රියව දායක කරවා ගැනීම.
    - රාජ්‍ය සේවයේ සිදුවන මෙම යහපත් පරිවර්තනය පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කර ඔවුන් තුළ රජය කෙරෙහි විශ්වාසය ගොඩනැගීම.
    - වංචාව, දූෂණය, නාස්තිය සහ අල්ලස පිටුදැකීමේ පණිවිඩය සමාජගත කිරීම — මෙය සඳහා ජාතික පියවරක් බව අවධාරණය කරන්න.
- සන්නාම තේමාව සිහිපත් කිරීම: Clean Sri Lanka හි මූලික කුළුණු තුන වන සමාජයීය, පරිසරයීය සහ සදාචාරාත්මක (Socially, Environmentally, Ethically) යන අංශ ඔස්සේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරන්න.
- **පටු දේශපාලනික හෝ පෞද්ගලික ප්‍රකාශවලින් වැළකීම: කිසිදු අයුරකින් දේශපාලනික කරුණු, පෞද්ගලික මතිමතාන්තර හෝ ආයතනික ගැටුම් මාධ්‍ය හමුවේ ප්‍රකාශ නොකළ යුතුය. අවධානය සම්පූර්ණයෙන්ම ව්‍යාපෘතියේ පොදු අරමුණු සහ ජනතා සහභාගීත්වය දෙසට යොමු කළ යුතුය.**
- ප්‍රජා දායකත්වය අගය කිරීම: වැඩසටහන සාර්ථක කර ගැනීමට දායක වන ප්‍රදේශවාසීන්, ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය/පෞද්ගලික ආයතනවල සාමූහික උත්සාහය (Teamwork) සැමවිටම අගය කරමින් කතා කරන්න.

**අනුමැතිය සහ නිකුත් කිරීම**

Clean Sri Lanka මාධ්‍ය සහ සන්නිවේදන අංශය